IBO
IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

22060267

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Monday 22 May 2006 (morning)
Lundi 22 mai 2006 (matin)
Lunes 22 de mayo de 2006 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.

**පහත දැක්වෙන ඡේද අතුරින් එකක් සඳහා විවරණයක් සපයන්න.**

1 (අ)

වියලි කලාපයේ වනාන්තරයක් වූ මේ පෙදෙසට වැස්ස ලැබුණේ ඊසාන මෝසමේ දී පමණෙකි. ඔක්තෝබරයේ දී කළු කරමින් සිට නොවැම්බර, දෙසැම්බර, ජනවාරි කාලයේ දී වසින්නට ගත් කල රෑ දවල් දෙකේ ඉස්පාසුවක් නැතිව, දවස් තුනේ හතරේ බැඳ-ගෙන වසිනු පෙනෙයි! එකල උඩරට කඳුකරයේ මෙන් ම අවට පිහිටි හෙල් මුදුන්, සිහින් වළා රොදින් වැසී යෙයි! වාතස්කන්ධය දැඩි-බර ගුණයෙකින් යුක්ත වෙයි! පොළොව ද පෙහවුණු පාන් ගෙඩියක් මෙන් මොළොක් ව එරෙන්නට වෙයි! නිරන්තර වර්ෂාවෙන් ගලඹයත්, එහි ශාඛා වූ පල්ලම් ඔය සහ එක්ගල් ආරුත් පිරී ඉතිරී යෙයි! අපමණ වනසත්තු ද, ගම් වල ගවාදි සත්තු ද වතුරේ ගොස් නැසෙති! ගොවිතැන් පාලු වී යයි! ගොයම් හැර අන් කිසිම වර්ගයෙක කුඩා පැළ මේ වැස්සට ඔරොත්තු නො දෙන හෙයින් හේන් ගොවිතැනට අපල වන්නේ ය. රෝද පාරවල ඇගිලි හැරී, රෝට්ටුවේ බෝක්කු පාලම් කැඩී බිඳී යන්නේ ය!

පෙබරවාරි, මාරතු කාලයේත් අතරින් පතර වැසි ලැබෙයි. අප්‍රේල් පසු වී නිරිත මෝසම ආරම්භ වූ විට, මෙහි එන්නේ, උඩරට කඳුකරයේ දී අන්තිම දිය බින්දුව දක්වා සූරා-ගෙන ඉතිරි වන වියලි සුළඟ පමණෙකි. ජූලි, අගෝස්තු වන විට සුළඟත් හිරු රැසත් වඩ-වඩා දැඩි වෙයි. වළාකුළින් තොර අහසෙහි දීප්තියෙන් බබළන සූර්යයා අකාරුණිකයකු මෙන් පොළොව පෙළන්නට වෙයි. එවිට ගලඹය, තැනින් තැන වළවල පමණක් රැඳුණු දිය ඇති වැලි තලයක් වෙයි. අන් ඔය කඳුරු, පත්ලෙහි බඹයක් යට පමණක් තෙතමනය ඉතිරි කොට වියළෙයි. ගස් වැල් වල කොළ හේ යයි. ඒ අතර හමන වේගවත් මාරුතය මළානික පැලැහැටි ඒ මේ අත ගසා, දුබල මහ ගස් ද මුලිනුපුටා හෙළා - දමමින් වන හිස සලිත කර ගෙන මහ කලහ කෙරෙයි!

වැස්සට කුණු නොවී රැකුණු හේන් වල බෝග මෙකල වියළී යෙයි. රට දුර්භික්ෂ වන්නාක් මෙන් හැඟෙයි. බොහෝ වන සත්තු ද ගවයෝ ද දිය උගුරක් නැතිව නැසෙති. හමන පවන ද නැතිව ඉර අව්ව තවත් බලවත් වන කල, එළිය දෙස බලන ඇස් ද දැවෙන්නට වෙයි. එකල දිගාමඩුල්ලට වැස්ස අරුමයෙකි!

මෙ බඳු දේශ ගුණයක් යටතේ වැඩුණු නොයෙක් වනසතුන් ගෙන් පිරුණු වනයෙකින් මේ භූමිය වැසුණේ ය. සෙසු වූයේ වන සාගරයෙක පුංචි දිවයින් මෙන් පිහිටි ගම් පමණෙකි.

ස්වභාවයේ ප්‍රකෘති අලංකාරය වනයෙහි දක්ක හැකි ය. මානුෂික හස්තයෙන් විපර්යාස නො කරන ලද එහි, අක්ලිෂ්ට ස්වභාවික සෞන්දර්යය ඇත්තේ ය. එහෙත් එය වර්ණනා කළ හැක්කේ වනයෙහි ම ඉපි ද එහි ම හැදී, වැඩී, උගත් කවියකුට පමණකි. එයට ආගන්තුකයකු වූ මා විසින් කළ හැක්කේ අන්ධයකු සිහිනයෙකින් දුටු දෙව් ලොවක් ගැන කරන වැනි වැණුමෙකි!

මායා රංජන්, දිගාමඩුල්ලේ ආශ්චර්යය, 1957

- **මේ වර්ණනයේ ප්‍රධාන තේමාව කුමක් ද?**
- **වනය පිළිබඳ කෙබඳු හැඟීම් මේ ඡේදයෙන් ජනිත වේ ද?**
- **හැඟීම් දැනවීම සඳහා භාෂාව සහ කාව්‍යමය යෙදුම් යොදා ඇති ආකාරය පිරික්සන්න.**
- **මේ වැනුම ඔබගේ සිත් ගනී ද? හේතු දක්වන්න.**

1 (ආ)

## අඳුර අපේ දුක නිවාවි

යමන් කලුවෙ ගෙදර යන්න, කන්ද උඩින් අඳුර එන ච
උඹට වගේ මගෙ ඇහටත් හරිම මාන්සි යි දැනෙන ච

අඳුර තමයි අපෙ ඇහපත, නිවන්න දෙවියෝ එව් චේ
හනික යමන් ගාල්වෙන්න පිදුරු ගොඩේ, ගෙයි මුල් ලේ

උදේ හිටන් අච්කට්ටේ, උඹව තියන් මැඩවෙච්ච ට
උඹේ හිතට අමාරුදූයි, කියාපන්කො දූන්වත් ම ට
කරුමෙ තමයි පළිසන් දෙන්නේ අපගේ මේ විදිය ට
බුදුහාමුදුරුවො කිව්වේ ඒක තමයි දුක නිවන් ට

ගෙදර ගිහින් ඇල ගාවින් හොඳ තණ කොළ ටිකක් උඹ ට
තලු ගහ ගහ, බඩ පිරෙන්න ගෙනැත් දුන්නම් කන්න ට
දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇහපත ගිනි නිවන් ට
හනික යමන් ගාල්වෙලා අඳුරු රෙද්ද පෙරව ගන් ට

මගේ කකුලෙ කටුඇනිලා, ඉවසන්නට බැහැ රිදේ චි
අන්දකාරෙ තෙල්ගාලා, ඒ විසකටු ඇද දමා චි

හැන්දෑවට උඹ ඉඳගෙන තලුගහනව මට ඇහෙන ච
උඹට කලුවෙ, හුහක් හොරද හැන්දෑවට නින්ද යන ච
අඳුර ඇවිත් මගෙ නලලට නම් මන්තරයක් කියන ච
ඒ එක්කම ඇහැ පියවිල එළිවෙන තුරු නින්ද යන ච

දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇහපත නිවාලන් ට
යමන් කලුවෙ ගාල්වෙලා, එකට වැටී නිදගන් ට

තුනටිය මගෙ කක්කියනව බොහොම නොසැහෙන විදිය ට
අඳුර හන්දිතෙල් ගාලා අතගාවිය එය හෙමිහි ට

අඳුර රෙද්ද පෙරවාලා අපෙ ඇහපත නිදිකරා චි
අඳුර අපේ දුක නිවලා දහක් ගින්දර නිවා චි

ගුණදාස අමරසේකර, භාව ගීත, 1960

- මේ කවි පන්තියෙහි ප්‍රධාන තේමාව කුමක් ද?
- මෙහි සඳහන් මිනිසා සහ ගවයා අතර ගොඩනැඟී ඇති සම්බන්ධතාව කෙබඳු ද?
- මේ කවි පෙළෙන් දැනවෙන හැඟීම් ගැන විවරණයක් සපයන්න.
- මේ කවි පෙළ ඔබගේ සිත් ගනී ද? හේතු දක්වන්න.